## ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව - 2010

----------------------------------------------------------

### 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මතය

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහය සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 1.2.1 ලැබිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2010 දෙසැම්බර් 31 දින වන විට ගිණුම් අනුව අපනයන බිල් මත ගෙවන ලද අත්තිකාරම් ශේෂය රු.34,958,636 ක් විය. එයින් වර්ෂ 04 සිට 05 දක්වා රු.774,445 ක් ද, වර්ෂ 05 - 06 අතර රු.3,475,434 ක් ද , වර්ෂ 6 - 7 ත් අතර රු.28,758,928 ක් ද, වර්ෂ 07 - 08 ත් අතර රු.1,949,829 ක් ද වශයෙන් අය නොවී පැවතුණු අතර, ඒ සඳහා ශේෂ සනාථ කිරීම්ද ලබාගෙන නොතිබුණි. මෙම සම්පූර්ණ මුදල සඳහාම අඩමාණ ණය ප්‍රතිපාදන සලසා ඇති බව සභාපති දැනුම් දී ඇත.

(ආ) සංස්ථාව විසින් 2006 වර්ෂයේදී රු.208,973,030 කට මිලදී ගෙන තිබුණු "විලාසිතා නිවස" රු.800,000 ක් වූ මාසික කුලී පදනමට පොලිස් දෙපාර්තමේන්තුවට ලබා දී තිබුණු අතර, 2010 ජූනි 15 දින සිට රජයට අත්පත් කරගෙන 2010 අගෝස්තු 11 උන පොලිස් දෙපාර්තමේන්තුවට භුක්තියට භාර දී තිබුණි. 2010 අගෝස්තු 10 දිනැති ලිපියෙන් විලාසිතා නිවස සඳහා වන්දි මුදලක් ගෙවන බව තිඹිරිගස්යාය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය දැනුම් දී තිබුණත්, එය ලැබී නොතිබුණ අතර, විලාසිතා නිවසේ පිරිවැය වූ රු.208,973,030 ක මුදල ලැබිය යුතු ඉඩම් ආයෝජනයක් ලෙස ගිණුම්වල දක්වා තිබුණි.

### 1.2.2 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණ වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතේ 11 (බී) වගන්තිය | භාණ්ඩාගාර බැඳුම්කර මත රු. 1,254,444,675 ක් සහ ඇමරිකන් ඩොලර් ස්ථාවර තැන්පතු මත මහජන බැංකුවේ රු.878,000 ක්, ලංකා බැංකුවේ රු.1,650,895 ක් හා යූරෝ ස්ථාවර තැන්පතු සඳහා රු.145,151 ක් වූ ආයෝජන සඳහා මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යවරයාගේ එකඟතාවය ලබාගෙන නොතිබුණි. |
| (ආ) 2004 ජූලි 29 හා අංක පීඊඩී 25 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | චක්‍රලේඛ විධි විධාන වලට පටහැනිව සංස්ථාවේ මුදල් රු.25,500,000 පෞද්ගලික බැංකුවල ආයෝජනය කර තිබුණි. |
| (ඇ) 2003 ජූනි 02 දින හා අංක 12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.12 වගන්තිය | ඉකුත් වර්ෂවලදී මෙන්ම සමාලෝචිත වර්ෂයේදීද, චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව රු.980,000 ක දායක මුදලක් සංස්ථා සුභ සාධක අරමුදලට ලබා දී තිබුණි. |
| (ඈ) 2000 ජනවාරි 31 දින හා අංක පීඑෆ්/පීඊ/6 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 24 වගන්තිය | ඉකුත් වර්ෂවලදී මෙන්ම සමාලෝචිත වර්ෂයේදීද, පනතේ විධි විධාන වලට පටහැනිව සේවකයින් විසින් ගෙවිය යුතු උපයන විට ගෙවීමේ බදු රු.1,166,498 ක් සංස්ථා අරමුදලින් ගෙවා තිබුණි. |
| (ඉ) 2006 සැප්තැම්බර් 22 දිනැති කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ චක්‍රලේඛ අංක 30 | චක්‍රලේඛය පරිදි සේවක මණ්ඩල නැවත කාණ්ඩගත කර, ඒ අනුව වැටුප් සංශෝධනයක් සිදු කර ගෙන නොතිබුණි. |

| | | |
|---|---|---|
| (ඊ) | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 වගන්තිය | කොන්දේසිවලට පටහැනිව අවස්ථා 5 කදී 50% ත් 100% ත් අතර ප්‍රමාණයන්ගෙන් අත්තිකාරම් ගෙවා තිබුණි. |
| (උ) | මු.රෙ. 1645(අ) | අවස්ථා 18 කදී රු.89,759 ක් වැය කරමින් සිදු කරන ලද වාහන සේවා කිරීම් හා අමතර කොටස් සැපයීම සම්බන්ධ විස්තර ලොග් පොත්වල සටහන් කර නොතිබුණි. |
| (ඌ) | මු.රෙ. 104(3) | අලාභහානි ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. |

## 2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

------------------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

--------------

සමාලෝචිත වර්ෂය තුල සංස්ථාවේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු.54,439,370 ක ශුද්ධ ලාභයක් වූ අතර, ඊට අනුරූපව ඉකුත් වර්ෂය සඳහා වූ ශුද්ධ ලාභය රු.79,648,411 ක් වූයෙන් වර්ෂය සඳහා ශුද්ධ ලාභය රු.25,209,041 කින් අඩුවී තිබුණි. ඒ සඳහා ආයෝජන ආදායම රු.21,055,894 කින් ද, කුලී ආදායම රු.5,200,000 කින් ද, අඩුවීම ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

### 2.1.1 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

----------------------------------

ආදායම් බදුවලට පෙර සමස්ථ ශුද්ධ ලාභය රු.108,187,543 ක් වුවත් මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු.30,252,223 ක ශුද්ධ ලාභයක් විය. ඒ අනුව, රු.108,187,543 ක් වූ මුළු ශුද්ධ ලාභයෙන්, 76% ක් ආයෝජන ආදායම් වලින්ද, 28% ක් මෙහෙයුම් ලාභයෙන්ද, 4% ක් වෙනත් ආදායම් වලින් නියෝජනය වී තිබුණු අතර, විනිමය අලාභය 8% කි. ඒ අනුව පසුගිය වර්ෂය හා සසඳන විට සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ශුද්ධ ලාභය 93% වැඩිවීමක් හා මුළු ශුද්ධ ලාභය 17% ක අඩුවීමක්ද දක්නට ලැබුණි.

## 2.2 කාර්ය සාධනය

-----------------

**(අ) 2010 ක්‍රියාකාරී සැලැස්මේ ඉලක්ක ලඟා කර ගැනීම**

---------------------------------------------------------

පහත සඳහන් රක්ෂණ ඔප්පු හා ඇපකර ප්‍රමාණයන් ඉලක්කගත සංඛ්‍යා කරා ළගා වීමට නොහැකි වී තිබුණි.

| ඔප්පු හා ඇපකර වර්ගය | ක්‍රියාකාරී සැලැස්මට අනුව සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව ඇස්තමේන්තු ගත සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස % |
|---|---|---|---|
| (i) අපනයන ගෙවීම් රක්ෂණ ඔප්පු | 40 | 21 | 53 |
| (ii) පූර්ව නැව් ගත කිරීමේ ඇප සහතික | 12 | 10 | 83 |
| (iii) පශ්වාත් නැව්ගත කිරීමේ ඇප සහතික | 12 | 06 | 50 |

සමාලෝචිත වර්ෂයේදී අපනයන කාර්ය සාධන ඇප සහතික ක්‍රමය සහ ගුවන් ගමන් වියදම් ඇප සහතික ක්‍රමය හැර අනෙකුත් ඔප්පු හා ඇපකර නිකුත් කිරීමට අදාල වූ ඉලක්කගත සංඛ්‍යාවෙන් සම්පූර්ණ කර ගෙන තිබූ ප්‍රමාණයන් 50% සිට 83% අතර පරාසයක විය.

**(ආ) පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ රක්ෂණ ඔප්පු හා ඇපකර අඩුවෙන් නිකුත් කිරීම**

විස්තර පහත දැක්වේ.

| | | 2010 | 2009 | සාපේක්ෂ (අඩුවීම) වැඩිවීම |
|---|---|---|---|---|
| | | සංඛ්‍යාව | සංඛ්‍යාව | සංඛ්‍යාවේ ප්‍රතිශතයක් ලෙස |
| | | | | % |
| (i) | අපනයන ගෙවීම් රක්ෂණ ඔප්පු | 21 | 25 | (16) |
| (ii) | පූර්ව නැව් ගත කිරීමේ ඇප සහතික | 10 | 13 | (23) |

සමාලෝචිත වර්ෂයේදී අපනයන කාර්ය සාධන ඇප සහතික ක්‍රමය, ගුවන් ගමන් වියදම් ඇප සහතික ක්‍රමය සහ පශ්චාත් නැව්ගත කිරීමේ ඇප සහතික ක්‍රමය හැර අනෙකුත් ඔප්පු සහ ඇප සහතික නිකුත් කරීමට අදාල වූ ප්‍රතිශතයන් 16% සිට 23% අතර පරාසයක අඩුවීමක් දක්නට ලැබුණි.

## 2.3 කාර්ය මණ්ඩල පිරිවැය

සංස්ථාවේ අනුමත කාර්ය මණ්ඩලය 56 දෙනෙකු වූ අතර, තථ්‍ය කාර්ය මණ්ඩලය 42 ක් වූයෙන් 2010 දෙසැම්බර් 31 දිනට කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සංඛ්‍යාව 14 ක් විය.

## 2.4 අයවැය ලේඛනමය පාලනය

ඇස්තමේන්තුගත මූලධන වියදම රු.6,472,750 ක් වූ නමුත් සමාලෝචිත වර්ෂයේදී උපයෝගී කරගෙන තිබුණේ රු.159,819 ක් හෙවත් 2.5% ක් පමණක් වූ අතර, ඇස්තමේන්තුගත කරන ලද පුනරාවර්තන වියදම්වලින් 92% ක උපයෝගී කර ගෙන තිබුණි. මේ අනුව අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

## 3. පද්ධති හා පාලන

-------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ සභාපතිවරයාගේ අවධානයට වරින් වර යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කල යුතුය.

(අ) අපනයන බිල් මත වූ අත්තිකාරම් ආපසු අයකර ගැනීම.

(ආ) ඔප්පු හා ඇපකර නිකුත් කිරීම හා හිමිකම් පෑම් සඳහා ගෙවීම් කිරීම.

(ඇ) ක්‍රියාකාරී සැලැස්මට අනුව වූ ඉලක්ක ලඟාකර ගැනීම.

(ඈ) අතිරික්ත මුදල් ආයෝජනය කිරීම.